10	අජන්තා නිරෝෂණී මහත්මිය	**The Influence of First Language on English as a Second Language Writings of Undergraduates of a South Asian University** 2022 Interventions and intersections conference **The influence of the 1st language on English as a second language writing of undergraduates in a South Asian University** 5th International Conference on Research in Education, Teaching and Learning
11	ආචාර්ය සුමුදු ඇමෝගම	Embogama, N. (2022, June). **A feminist perspective of the legends pertaining to the origination of goddess Pattini.** *Journal of Research and Development; a Multidisciplinary International Level Referred and Peer Reviewed Journal*, *14*(5), 177–181. - PAPER Embogama, S. N. (2022, September). **Perceptions of Dance Undergraduates Regarding the Adoption of a Learning Management System during a Crisis Context**. *Proceedings of the 5th International Research Symposium 2022 Swamy Vipulananda Institute of Aesthetic Studies, Eastern University, Sri Lanka*, 186–191. - PAPER Embogama, R. M. S. N. (2022, November). **A study of performing arts undergraduates' needs and perceptions of learning ESL at the tertiary level: insights for syllabus design.** *Abstracts of the 5th INTERNATIONAL RESEARCH CONFERENCE – TRINCO-2022 Trincomalee Campus Eastern University, Sri Lanka*, 28. – ABSTRACT Embogama, R. M. S. N. (2022, November). **Emigration of Sri Lankan tea plantation workers in a crisis-ridden context:** A case study. *4 The International Research Symposium on Social Sciences and Humanities (IRSSSH) 2022 SRI LANKA IN CRISIS: SEARCH FOR A WAY OUT - ABSTRACT* Embogama, R. M. S. N. (2022, December). **Adult Learners' Perceptions of a Blog-based Assessment in an English as a Second Language Course.** *"DEFINING THE ROLE OF TECHNOLOGY FOR ECONOMIC DEVELOPMENT OF A COUNTRY" International Conference on Advances in Technology and Computing (ICATC–2022) Proceedings 3rd December 2022*. PAPER

24. ජාත්‍යන්තර සබඳතා ඒකකය

විශ්වවිද්‍යාල ජාත්‍යන්තර සබඳතා ඒකකය විසින් පහත ක්‍රියාකාරකම් 2022 වර්ෂය තුල සිදු කරන ලදී.

1. ජාත්‍යන්තර දත්ත සමුදාය තත්ව වාර්තා (status report) සමඟ යාවත්කාලීන කිරීම

2. ජර්මානු සංස්කෘතික මධ්‍යස්ථානය (Goethe Institut) සමග එක්වෙමින් දෘශ්‍ය කලා පීඨය විසින් "Critical Zone" නමින් අන්තර්ජාතික ප්‍රදර්ශනය 2022 නොවැම්බර් මස 10 සිට 27 දක්වා සාර්ථකව පැවැත්වීම
    - ප්‍රදර්ශනයට සමගාමීව වැඩමුළු, පර්යේෂණ සහ තවත් බොහෝ ක්‍රියාකාරකම් සිදු කරන ලදි
    - මෙහිදී පිරිසිදු සහ හරිත මූලධර්ම සියළු මෙහෙයුම් සමග ඒකාබද්ධ කරන ලදි

3. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය හා පන්ජාබයේ චිත්කාරා විශ්වවිද්‍යාලය, (Chitkara University Punjab) අතර අවබෝධතා ගිවිසුමකට එළඹීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදි.
    - අවබෝධතා ගිවිසුමකට එළඹීමේ හැකියාව සම්බන්ධයෙන් අදාළ පාර්ශව සම්බන්ධයෙන් රැස්වීම් පැවැත්වීම.
    - අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා 2022 නොවැම්බර් මස 17 පැවති 194 වන විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීම.
    - සම්මත කරගත් ගිවිසුම 2022 දෙසැම්බර් මස 29 වන දින චිත්කාරා විශ්වවිද්‍යාලයට යොමු කිරීම මේ වන විට අවසන් කර ඇති අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම නුදුරු අනාගතයේ දී සිදුවනු ඇත.

4. සෙල්කුක් විශ්වවිද්‍යාලය, තුර්කිය (Selcuk University, Konya -Turkey) සමග එළඹ ඇති අවබෝධතා ගිවිසුම ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම
    - අධ්‍යයන හුවමාරු කටයුතු ක්‍රියාත්මක කිරීමේ හැකියාව සොයා බැලීම සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් සමග සාකච්ඡා පැවැත්වීම.

25. විගණන කමිටු වාර්තාව - 2022

විගණන කමිටු සංයුතිය හා රැස්වීම්

පාලක සභාව විසින් පත් කරනු ලබන පාලක සභා සාමාජිකයන් තිදෙනෙකුගෙන් හා ලේඛකාධිකාරීවරයාගෙන් විගණන කමිටුව සමන්විත වේ.

පහත නම් සඳහන් මහත්ම මහත්මීන් සමාලෝචිත වර්ෂය තුළදී විගණන කමිටු සාමාජිකයින් වශයෙන් කටයුතු කරන ලදී.

ටී. ධර්මරාජා මහතා	-	සභාපති/පාලක සභා සාමාජික
මහාචාර්ය කුසුමා කරුණාරත්න මිය	-	සාමාජික/පාලක සභා සාමාජික
මහාචාර්ය නිමල් කීර්ති දංගල්ල මහතා	-	සාමාජික/පාලක සභා සාමාජික
බී. එම්. දයාවංශ මයා	-	සාමාජික/ලේඛකාධිකාරී

<u>නිරීක්ෂක</u>

පී.එම්.ආර්. පතිරාජ මයා	-	විගණන අධිකාරී

ඉටුකරන ලද කාර්යයන්

1. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණන සැලැස්ම ක්‍රියාත්මක කරන ලදී.

2. ජාතික විගණන කාර්යාලය විසින් යොමු කරනු ලබන විගණන විමසුම් නිරීක්ෂණය කර ඉදිරියේදී එම තත්වයන් නැවත ඇති නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිර්දේශ ලබා දීමට කටයුතු කිරීම.

3. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුලත්ව එහි කටයුතු පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවේ සඳහන් එක් එක් නිරීක්ෂණය සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් විසින් ඒ සඳහා ගෙන ඇති,/ ගැනීමට නියමිත ක්‍රියාමාර්ග හා ඒවා නිවැරදි කිරීම සඳහා ගනු ලබන කාලය පිළිබඳ වාර්තාව විමර්ශනය කර අවශ්‍ය නිර්දේශ සහිතව පාලක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

26 <u>තිරසර සංවර්ධනය මත පදනම් කරගත් අනාගත අපේක්ෂා පිළිබඳ වාර්තාව</u>

එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රයට අනුව වඩා යහපත් සහ තිරසාර අනාගතයක් සාක්ෂාත් කර ගැනීම සඳහා තිරසර සංවර්ධන ඉලක්ක 17 ක් හඳුන්වා දී ඇත. ඒ අනුව තිරසර සංවර්ධනයට දායක වීම සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයද තිරසර සංවර්ධන ඉලක්ක වලට අනුගත වෙමින් 2021-2023 උපායමාර්ගික සැලැස්ම සකස් කර ඇත.

විශ්වවිද්‍යාලීය 2021-2023 උපායමාර්ගික සැලැස්ම හා 2022 ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා සෘජුව හා වක්‍රව සම්බන්ධ වේ.

තිරසර සංවර්ධන ඉලක්ක 04. ගුණාත්මක අධ්‍යාපනය

ගුණාත්මක අධ්‍යාපනය විශ්වවිද්‍යාල උපායමාර්ගික සැලැස්මේ දක්වා ඇති පහත සඳහන් ඉලක්ක සමඟ සෘජුව සම්බන්ධ වී ඇති ප්‍රධාන ඉලක්කයයි.

- ඉලක්ක අංක 01 - උපාධිධාරී රැකියා නියුක්තිය
- ඉලක්ක අංක 02 - පර්යේෂණ සහ ප්‍රකාශන

- ඉලක්ක අංක 03 - නවෝත්පාදන සහ නිර්මාණාත්මක කාර්යයන්
- ඉලක්ක අංක 04 - ජාතික සහ ජාත්‍යන්තර දායකත්වය
- ඉලක්ක අංක 05 - මූල්‍ය තිරසාරත්වය
- ඉලක්ක අංක 06 - ජාත්‍යන්තර ඉදිරි දැක්ම

මෙම ඉලක්ක වලට අදාළ සියළුම ක්‍රියාකාරකම් පාහේ ගුණාත්මක අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීමට සෘජුව දායක වේ.

ගුණාත්මක අධ්‍යාපනය සවිබල ගැන්වීම මගින් පරිසරය ආරක්ෂා කිරීම සහ ආපදා බලපෑම් අවම කිරීම සඳහා වක්‍රව සම්බන්ධ වෙමින් අධ්‍යාපනයේ ඉහලම මට්ටමට පැමිණීමට විශ්වවිද්‍යාලය දායක වේ. මේ සඳහා පහත ක්‍රියාකාරකම් විශ්වවිද්‍යාල උපායමාර්ගික සැලැස්මට ඇතුළත් කර ඇත.

- නව විෂය මාලාවක් හඳුන්වා දීම
- සියලුම ශිෂ්‍ය ගැටළු සඳහා උපදේශන ලබා දීම
- සම්මන්ත්‍රණ පැවැත්වීම
- ශිෂ්‍ය තෘප්තිමත් භාවය පිළිබඳ සමීක්ෂණ පැවැත්වීම
- ඉගැන්වීම් සහ ඉගෙනුම් කටයුතු වලට අදාළ යටිතල පහසුකම්, උපකරණ දියුණු කිරීම
- නව්‍ය සහ සෞඛ්‍ය සම්පන්න භාවිතයන් පිළිබඳ වැඩසටහන් පවත්වමින් ක්‍රියාකාරී ලෝකය සමග සම්බන්ධ වීමට සිසුන් දිරිමත් කිරීම
- සංස්කෘතික හා සංගීත කලා උත්සව පැවැත්වීම
- නව උපාධි පාඨමාලා හඳුන්වා දීම
- ප්‍රතිඵල පදනම් කරගත් ඉගෙනුම් ක්‍රියාවලිය පිළිබඳ වැඩමුළු පැවැත්වීම
- විෂයානුබද්ධ ඉංග්‍රිසි පාඨමාලා හඳුන්වා දීම

තිරසර සංවර්ධන ඉලක්ක 05. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

විශ්වවිද්‍යාලය මගින් ක්‍රියාත්මක වන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා වන ඒකකය මගින් ස්ත්‍රී පුරුෂ දෙඅංශයෙන්ම විශ්වවිද්‍යාල අධ්‍යාපනයට සමාන ප්‍රවේශය සහතික කිරීම සහ සියලු ආකාරයේ ප්‍රචණ්ඩත්වය තුරන් කිරීමට කටයුතු කරයි.

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහතික කිරීමට සහ ආපදා බලපෑම අවම කිරීම සඳහා මෙම මධ්‍යස්ථානය යටතේ උපායමාර්ගික සැලැස්මට පහත ක්‍රියාමාර්ග එක් කර ඇත.

- විශ්වවිද්‍යාලය සඳහා ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජවාදය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ ක්‍රියාකාරී කමිටුවක් පත් කිරීම
- ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජවාදය පිළිබඳ ආයතනික ප්‍රතිපත්ති ලේඛනයක් හඳුන්වා දීම
- ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජවාදය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීම
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පර්යේෂණ ලිපි, පොත් පරිච්ඡේද ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රකාශ කිරීම
- ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජවාදය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ තේරීම් පාඨමාලා මොඩියුලය හඳුන්වා දීම

තිරසර සංවර්ධන ඉලක්ක 07. දැරිය හැකි පිරිසිදු බලශක්තිය සහ තිරසර සංවර්ධන ඉලක්ක 12. වගකීම් සහිත පරිභෝජනය සහ නිෂ්පාදනය

විශ්වවිද්‍යාල ඉලක්ක අංක 03 නවෝත්පාදන හා නිර්මාණාත්මක කාර්යයන්, ඉලක්ක 04 මූල්‍යමය තිරසාරත්වය සාක්ෂාත් කර ගැනීම තුළින් ඉහත සඳහන් තිරසර සංවර්ධන ඉලක්ක ලගා කර ගත හැක. මේ සඳහා පහත සඳහන් ක්‍රියාකාරම් උපායමාර්ගික සැලැස්මට ඇතුළත් කර ඇත.

- විශ්වවිද්‍යාලයට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම
- විශ්වවිද්‍යාලයේ විද්‍යුත් කළමණාකරන පද්ධතිය සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම
- බුද්ධිමය දේපල, නවෝත්පාදන සහ නිර්මාණශීලිත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා වැඩමුළු පැවත්වීම

විශ්වවිද්‍යාලය ලිපි ද්‍රව්‍ය හා බලශක්තිය භාවිතය අවම කිරීම තුලින් පරිසරය සුරකීමට වක්‍රව දායක වෙමින් තිරසර සංවර්ධනයට දායකත්වය සපයයි.

තිරසර සංවර්ධන ඉලක්ක 17. අරමුණු සඳහා ගෝලීය සහයෝගීතාවය

විශ්වවිද්‍යාල ඉලක්ක අංක 04 ජාතික හා ජාත්‍යන්තර දායකත්වයන් සහ ඉලක්ක අංක 06 ජාත්‍යන්තර දැක්ම සාක්ෂාත් කර ගැනීම තුළින් තිරසර සංවර්ධන ඉලක්ක 17 හි අරමුණු සඳහා හවුල්කාරිත්වය සපුරා ගත හැක.

ඉහත අරමුණ ඉටු කර ගැනීම සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම් උපායමාර්ගික සැලැස්ම සමග ඒකාබද්ධ කර ඇත.

- ලොව පුරා සිටින ජාතික /ජාත්‍යන්තර විද්වතුන් සමග වැඩමුළු පැවැත්වීම.
- පිළිගත් ජාත්‍යන්තර ආයතන සහ සංවිධාන සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම
- ජාත්‍යන්තර ද්විවාර්ෂික කලාකරුවන්ගේ හමුව පැවැත්වීම
- ජාත්‍යන්තර ව්‍යවසායකත්ව සම්මන්ත්‍රණ වලට ආරාධනා කිරීම සහ සහභාගී වීම

මෙම ක්‍රියාකාරකම් මගින් පරිසර සුරක්ෂිතාවයට ඍජු සහ වක්‍ර දායකත්වයක් සපයයි. පෘථිවියේ තිරණාත්මක තත්වයන් පිළිබඳව ජර්මානු සංස්කෘතික මධ්‍යස්ථානය සමග එක්ව පවත්වනු ලැබූ විවේචනාත්මක කලාපය වැනි ප්‍රදර්ශන පරිසරයේ ආරක්ෂාවට ඍජු දායකත්වයක් දක්වයි.

ඒ අනුව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය තිරසර සංවර්ධන සංකල්පයට අනුගත වෙමින් 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම ට අදාළ කාර්යයන් ක්‍රියාත්මක කරන ලද අතර 2021-2023 උපාය මාර්ගික සැලැස්ම ට අනුගතව ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කෙරේ.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය
(2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා)
(ආසන්නතම රුපියලට සකසන ලද සංඛ්‍යා)

	සටහන්	2022 රු.	(නැවත ප්‍රකාශිත) 2021 රු.
ආදායම්			
නුවමාරු නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම් - පුනරාවර්තන			
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය		1,187,000,000	1,113,000,000
ක්‍රීඩා සඳහා විශේෂ ප්‍රදානය - U.G.C		2,500,000	-
ප්‍රදාන - ශිෂ්‍යාධාර		16,288,000	26,204,000
විශේෂ ආධාර අරමුදල		500,000	-
නුවමාරු නොවන ගනුදෙනු වලින් මුළු ආදායම් - පුනරාවර්තන		**1,206,288,000**	**1,139,204,000**
නුවමාරු වන ගනුදෙනු වලින් ලැබෙන ආදායම් - පුනරාවර්තන			
පොලී ආදායම්	3	6,845,122	3,956,649
විවිධ ආදායම්	3.01	21,256,438	8,764,462
නුවමාරු වන ගනුදෙනු වලින් මුළු ආදායම් - පුනරාවර්තන		**28,101,560**	**12,721,111**
ආදායම් - පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය		715,585	1,532,019
ආදායම් - විචෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය (CODL)		12,511,094	4,171,818
මුළු ආදායම් - පුනරාවර්තන		**1,247,616,239**	**1,157,628,948**
මෙහෙයුම් වියදම් - පුනරාවර්තන			
සේවක වැටුප්	4.01	983,594,685	893,364,644
ගමනාගමන වියදම්	4.02	769,219	241,127
සැපයුම්	5	26,432,175	13,814,046
නඩත්තු	6	21,030,369	16,452,053
ගිවිසුම්ගත සේවා	7	162,170,037	91,380,734
වෙනත් පුනරාවර්තන වියදම්	8.01	26,169,995	28,061,286
මහපොල ශිෂ්‍යත්ව	8.02	455,700	-
ශිෂ්‍යාධාර	8.03	16,288,000	26,204,000
සේවා කළ නොහැකි ස්ථාවර වත්කම් අපහරණය කිරීමේදී වූ පාඩු		96,316	-
යෝග්‍යතා පරීක්ෂණ වියදම්		4,541,562	-
පාරිභෝගික දීමනාව		(43,461,919)	(62,698,941)
මෙහෙයුම් වියදම්		**1,198,086,139**	**1,006,818,949**
පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ වියදම්		319,121	1,082,373
CODL වියදම්		6,352,193	1,665,769
මුළු මෙහෙයුම් වියදම්		**1,204,757,453**	**1,009,567,092**
කාල සීමාව සඳහා පුනරාවර්තන අතිරික්තය / (ඌනතාවය)		42,858,786	148,061,857
නුවමාරු නොවන ගනුදෙනු වලින් ආදායම් - ප්‍රාග්ධන			
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය		120,000,000	275,000,000
කෘෂ , පරිත්‍යාග, භාණ්ඩ වර්ග - දේශීය		-	-
කෘෂ, පරිත්‍යාග, භාණ්ඩ වර්ග - විදේශීය	29	10,981,424	122,000.00
වෙනත් ප්‍රදාන (අතිරේක බදවා ගැනීම්, ක්‍රීඩා, පර්යේෂණ සහ නැලපීම්)		-	26,624,942
විශේෂිත අරමුදල් වලින් මාරු කරන ලද අරමුදල් (V.C අරමුදල)		73,900	-
නුවමාරු නොවන ගනුදෙනු වලින් මුළු ආදායම් - ප්‍රාග්ධන		131,055,324	301,746,942
මෙහෙයුම් වියදම් - ප්‍රාග්ධන			
ක්ෂයවීම් සහ ක්ෂය කිරීම්		224,175,073	187,311,108
පුනරුත්ථාපන වියදම් - ප්‍රාග්ධන නොවන ස්වභාවය		35,291,375	5,070,584
මුළු මෙහෙයුම් වියදම් - ප්‍රාග්ධන		**259,466,447**	**192,381,692**
කාල සීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය / (ඌනතාවය)		(128,411,123)	109,365,250
කාල සීමාව සඳහා මුළු අතිරික්තය / (ඌනතාවය)		(85,552,337)	257,427,107

කාල සීමාව සඳහා පුනරාවර්තන, ප්‍රාග්ධන, FGS සහ CODL අතිරික්තය හෝ ඌනතාවය), පහත දැක්වෙන පරිදි කාල සීමාව සඳහා මුළු අතිරික්තය / (ඌනතාවය) තුළ ඇතුළත් වේ

කාල සීමාව සඳහා පුනරාවර්තන අතිරික්තය / (ඌනතාවය) - පුනරාවර්තන සමුච්චිත අරමුදලට මාරු කිරීම	36,303,421	145,106,162
කාල සීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය / (ඌනතාවය) - ප්‍රාග්ධන සමුච්චිත අරමුදලට මාරු කිරීම	(128,411,123)	109,365,250
කාල සීමාව සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය (FGS) අතිරික්තය / (ඌනතාවය)	396,464	449,646
කාල සීමාව සඳහා CODL අතිරික්තය / (ඌනතාවය)	6,158,901	2,506,049
	(85,552,337)	**257,427,107**

පිටු 05 සිට 18 දක්වා ඇති සටහන් සහ පිටු 19 සිට 30 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්‍ය අංගයක් වේ.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
2022.12.31-දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
(ආසන්නතම රුපියලට සකසන ලද සංඛ්‍යා)

වත්කම්	සටහන්	2022 රු.	(නැවත ප්‍රකාශිත) 2021 රු.
ජංගම නොවන වත්කම්			
ආයෝජන	20	5,632,847	5,304,162
දේපල, පිරියා සහ උපකරණ	10	4,742,749,765	3,837,385,543
අස්පෘශ්‍ය වත්කම්	11	2,990,228	3,752,666
ප්‍රාග්ධන - කෙරිගෙන යන වැඩ	21	8,592,301	884,635,790
ප්‍රාග්ධන අත්තිකාරම්	17	6,903,890	6,903,890
		4,766,869,031	**4,737,982,050**
ජංගම වත්කම්			
මුදල් හා මුදල් වලට සමාන දෑ	12	22,776,177	55,353,929
ලැබිය යුතු දෑ	13	20,623,909	19,235,057
කෙටිකාලීන ආයෝජන (විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය)		37,000,000	39,905,996
තොග	14	9,905,823	9,284,788
ඉදිරියට කළ ගෙවීම්	15	45,639,826	40,541,129
අත්තිකාරම්	16	41,350	10,320
කාර්යමණ්ඩලය සඳහා ණය හා අත්තිකාරම්	18	48,142,106	52,432,002
බාහිර පාර්ශවයන් වෙත වූ කැන්පතු	19	883,696	353,594
		185,012,886	**217,116,814**
මුළු වත්කම්		**4,951,881,917**	**4,955,098,865**
වගකීම්			
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	24	105,099,347	178,825,754
		105,099,347	**178,825,754**
විලම්බිත ආදායම - විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය	30	**4,496,599**	**5,138,641**
ජංගම වගකීම්			
උපචිත වියදම්	22	39,085,453	14,856,451
වෙනත් ගෙවිය යුතු දෑ	23	148,985,394	22,801,346
කැන්පතු හා රඳවා ගැනීම්	25	67,352,041	66,128,632
කෙටිකාලීන වෙන් කිරීම්	26	2,614,590	2,502,590
		258,037,478	**106,289,019**
මුළු වගකීම්		**367,633,425**	**290,253,414**
ශුද්ධ වත්කම්		**4,584,248,493**	**4,664,845,450**
ශුද්ධ වත්කම්/ ස්කන්ධය			
සමුච්චිත අරමුදල් - ප්‍රතිසංවිධාන		(68,730,077)	(105,851,058)
සමුච්චිත අරමුදල් - ප්‍රාග්ධන		2,413,762,192	2,542,173,315
සීමා කළ අරමුදල් (විශේෂිත අරමුදල්)	27	33,698,010	28,548,858
ප්‍රත්‍යාගණන අතිරික්තය	28	2,149,157,473	2,149,157,473
සමුච්චිත අරමුදල- පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය		2,678,739	2,356,759
සමුච්චිත අරමුදල- විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය		53,682,152	48,460,099
මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධය		**4,584,248,493**	**4,664,845,450**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 (I) හා 107 (II) වගන්ති, 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාරව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කොට ඉදිරිපත් කර ඇත.

ඩබ්ලියු.එම්.ඩබ්ලියු. වන්නිනායක (මූල්‍යාධිකාරී) ඩී. එන් ගුරුසිංහ ලේඛකාධිකාරී (වැඩ බලන)

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පාලක සභාව වගකීම් දරයි. මෙම මූල්‍ය ප්‍රකාශ පාලක සභාව විසින් අනුමත කරනු ලැබූ අතර පාලක සභාව වෙනුවෙන් 2023 ජූනි 09 දින අත්සන් කරන ලදී.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රෝහණ පී. මහලියනආරච්චි (උපකුලපති)

ආචාර්ය සී පසිරාජ (පාලක සභා සාමාජික)
.....

ටී. ධර්මරාජා (පාලක සභා සාමාජික)
.....

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ස්කන්ධය හා ශුද්ධ වත්කම් වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශනය
(ආසන්නතම රුපියලට සකසන ලද සංඛ්‍යා)

රු.

	සමුච්චිත අරමුදල් ප්‍රතිවර්ගීකරණ	සමුච්චිත අරමුදල් ප්‍රාග්ධන	සමුච්චිත අතිරික්තය/(ඌනතාවය)	මිශ්‍රකළ අරමුදල් (විශේෂිත අරමුදල්) සටහන අංක 27	පශ්චාත් උපයෝ අධිකතන මිශ්‍ර අරමුදල	ව.ජා.ද.ආ.අක්ෂීන්ධ අරමුදල	ප්‍රාග්ධන ප්‍රදාන වියදම් කරන ලද	වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන	මූලික නොවන රජයේ ප්‍රදාන	පරිත්‍යාග සටහන 29	ප්‍රකාශගතගත අතිරික්තය	මුළු එකතුව
2021.01.01 දිනට ශේෂය (කලින් වාර්තා කළ පරිදි)	-	-	(230,535,418)	24,256,419	1,927,313	46,442,388	2,173,635,578	(157,930,845)	314,046,649	81,074,897	2,149,157,473	4,402,074,453
සමගිය වසරවලට අදාළව ගැලපීම් (සටහන ඇ)	-	-	(16,445,287)	-	-	-	9,013,318	-	7,431,969	-	-	-
2021.01.01 දිනට ශේෂය (නැවත ප්‍රකාශිත)	-	-	(246,980,705)	24,256,419	1,927,313	46,442,388	2,182,648,896	(157,930,845)	321,478,618	81,074,897	2,149,157,473	4,402,074,453
අත වසරවලට අදාළව ගැලපීම්	-	-	1,559,985	-	-	-	-	-	-	-	-	1,559,985
වර්ෂය තුළ වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන	-	-	-	-	-	-	304,884,538	(304,884,538)	-	-	-	-
වර්ෂය තුළ වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන (ප්‍රතිවර්ගීකරණ හේතුවෙන්)	-	-	-	-	-	-	(5,070,584)	-	-	-	-	(5,070,584)
වර්ෂය තුළ ලැබුණු පරිත්‍යාග	-	-	-	-	-	-	-	-	-	122,000	-	122,000
වර්ෂය තුළ ලැබුණු අරමුදල්	-	-	-	4,292,439	(20,200)	(488,338)	-	301,681,442	-	-	-	305,465,344
මුල් කිරීම් හිමිම	-	-	-	-	-	-	(164,005,848)	-	(23,305,261)	-	-	(187,311,109)
වසරේ අතිරික්තය	-	-	103,049,662	-	449,646	2,506,049	-	-	-	-	-	106,005,357
2021-12-31 දිනට ශේෂය (SLPSAS 11 අනුව - නැවත ප්‍රකාශිත)			(142,371,058)	28,548,858	2,356,759	48,460,099	2,318,457,003	(161,133,941)	298,173,357	81,196,897	2,149,157,473	4,622,845,446
SLIPSAS 11අනුව සමුච්චිත අරමුදලට නැවත හඳුනාදීම් කළ ප්‍රතිවර්ගීකරණ (සටහන අ)	(142,371,058)	-	142,371,058	-	-	-	-	-	-	-	-	-
SLIPSAS 11 අනුව සමුච්චිත අරමුදලට නැවත හඳුනාදීම් කළ ප්‍රාග්ධන (සටහන අ)	-	2,536,693,315	-	-	-	-	(2,318,457,003)	161,133,941	(298,173,357)	(81,196,897)	-	-
ගැලපීම් - මූලික නොවන රජයේ ප්‍රදාන අයි තුමන්ගය හිමිම (සටහන ඇ)	(2,360,000)	2,360,000	-	-	-	-	-	-	-	-	-	-
ගැලපීම් - රජයේ ප්‍රාග්ධන ප්‍රදානය අයි තුමන්ගය හිමිම - වියදම් (සටහන ඇ)	(3,120,000)	3,120,000	-	-	-	-	-	-	-	-	-	-
ගැලපීම් - 2021 සඳහා වාර්තා කරන ලද නොඉහැරීම් කුලී වියදම් (සටහන අ)	42,000,000											42,000,000
2022.01.01 දිනට ශේෂය (නැවත ප්‍රකාශිත)	(105,851,058)	2,542,173,315	-	28,548,858	2,356,759	48,460,099	-	-	-	-	2,149,157,473	4,664,845,446
අත වසරවලට අදාළව ගැලපීම් (සටහන ඊ)	817,560		-	(817,560)	-	-	-	-	-	-	-	-
අරමුදල් මාරු කිරීම්			-	(563,194)	-	-	-		-	-	-	(563,194)
වර්ෂය තුළ ලැබුණු අරමුදල්			-	6,529,906	(74,485)	(936,848)	-		-	-	-	5,518,573
වසරේ අතිරික්තය	36,303,421	(128,411,123)	-	-	396,464	6,158,901	-	-	-	-	-	(85,552,337)
2022.12.31 දිනට ශේෂය	(68,730,077)	2,413,762,192	-	33,698,010	2,678,739	53,682,152	-	-	-	-	2,149,157,473	4,584,248,489

සටහන :

අ රාජ්‍ය අංශයේ නව මිණුම්කරණ ප්‍රමිතීන් - ප්‍රථමාදර්ශ ගනුවනය සහ අඛණ්ඩ සඳහනකිරීම (SLPSAS 11) 2021 වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි 2022 වර්ෂයේදී අනුගත කරන ලදී. එම ප්‍රමිතිය රාජ්‍ය අංශයේ ආයතන සඳහා 2018 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වීය. ප්‍රමිතියට අනුව මෙම ප්‍රමිතිය අනුවර්තනය කිරීමට වසර තුනක් ලබා දී ඇත. මෙම වියවි විදහලය (UVPA) සමගිය වසර තුන තුළ මෙම ප්‍රමිතිය අනුවර්තනය කර නොතැබී බැවින්, UVPA විසින් මෙම මිණුම්කරණ ප්‍රමිතියේ ප්‍රතිපාදන අනුව පෙර වසරේ මිණුම් නැවත සකස් කර ඇත. රජවා නවා සත් අනුයිති වලට කුලී බලපෑම් සහන පරිදි වේ.

2021 දෙසැම්බර් 31 වැනි දිනට වාර්තා කරන ලද රදවාගත් අගැයීම් ශේෂය	106,005,357
අඩු : රජයේ ප්‍රාග්ධන ප්‍රදාන සහ මූල්‍ය නොවන ප්‍රදාන ප්‍රතිඝණ කිරීම	(187,311,108)
අඩු : රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	(4,610,584)
එකතු : ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්	275,000,000
එකතු : වෙනත් ප්‍රදාන ලැබීම්	26,624,942
එකතු : 2021 සඳහා වාර්තා කරන ලද නොඉහැරීමේ කුලී වියදම්	42,000,000
එකතු : පරිත්‍යාග ලැබීම්	122,000
අඩු: 2021 වර්ෂය තුළ වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදානය (ප්‍රතිවර්ගීකරණ හේතුවෙන්)- සටහන උ	(403,500)
2021 දෙසැම්බර් 31 වැනි දිනට අගැයීම් නැවත ප්‍රකාශ කර ඇත	257,427,107

සටහන :

අ: 2018 සිට 2020 දක්වා කාලය සඳහා මූලික නොවන ප්‍රදාන වන සීස් - ලැන්ඩ කෘෂෙර් රථය සහ ප්‍රකාශගතගතය කරන ලද වැන් රථ 02 ක් සඳහා රු. 7,431,969 ක අයි තුමන්ගය ප්‍රතිඝණය මූලික නොවන ප්‍රදාන අය කිරීමේ දෝෂය, 2018 සිට 2020 දක්වා කාලය සඳහා ප්‍රකාශගතගතය කරන ලද මෝටර් රථ 01 ක් සහ කැමි රථ 02 ක් සඳහා රු. 9,360,000 ක අයි තුමන්ගය ප්‍රතිඝණය වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන හිඟුමට අය කිරීමේ දෝෂය සහ 2020 වසරය සඳහා සීස් - ලැන්ඩ කෘෂෙර් අලුත්වැඩියා කිරීමේ සිවිධිය සඳහා රුපියල් 346,682 ක අය නොකළ ප්‍රතිඝණය වියදම් කළ ප්‍රාග්ධන ප්‍රදාන හිඟුමට අය කිරීම හිඟුමෙහි කිරීම නිවැරදි කිරීම (9,360,000 - 346,682 = 9,013,318 + 7,431,969 = 16,445,287)

ඇ : 2021 වසරය සඳහා සීස් - ලැන්ඩ කෘෂෙර් සහ ප්‍රකාශගතගත වැන් රථ 2 සඳහා මූලික නොවන ප්‍රදාන සඳහා අය කරන ලද රු.2,360,000 ක අධිපූර්ණය නිවැරදි කිරීම.

ඈ : 2021 වසරය සඳහා ප්‍රකාශගතගත මෝටර් රථ 01 සහ කැමි රථ 02 ඔබිමන්ධනයන් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන සඳහා අය කරන ලද රු.3,120,000 ක අධිපූර්ණය නිවැරදි කිරීම.

ඉ : 2022 වසරයේ වියදම් සඳහා අදාළ වන පරිදි 2021 මූලය වසරයේ 5% රදවා තබා ගැනීම් සහ ගෙවෙනවුවේ ලෙස සටහන් වියළුණු රු. 42,000,000 ක ගොඩනැඟිලි කුලිය, වියදම් ලෙස වාර්තා කිරීමේ දෝෂ නිවැරදි කිරීම.

ඊ: 2021 වසරය සඳහා දීන දඟවින සහ දීනෙහෙත් මූදලය කිසිවෙ රු.817,560 කින් 2021 වසරයේ දරන ලද වියදම් සඳහා VC අරමුදලෙන් (අරමුදල් කළමනාකරණ කාර්යාලය අනුමැතිය ඇතිව) අරමුදල් මාරු කිරීම් සඳහා ගැලපීම්.

උ : රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය රු. 5,014,084 ක් වූ අතර 2021 වසරය තුළ වියදම් කළ මුල් ප්‍රාග්ධන ප්‍රදාන (ප්‍රතිවර්ගීකරණ හේතුවෙන්) රුපියල් 5,070,584 කි. එනයේ වෙනස්, වියළි කිරීමේ දෝෂය නෙත්තුවෙන්, 2021 වසරේ මූලය ප්‍රකාශයේ එය පිළිගැබලින් රු.4,610,584 සහ රු.4,667,084 ලෙස අගැසුවීමකින් ඉදිරියේ කිරීම. එය ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය නිවැරදිව නිරූපණය වේ. එනයේ වෙනස් රුපියල් 403,500 ක වෙනස වියළිවියතාල වසරීගත අගැයීම් රු.103,049,662 ට බලපා නැත. එබැවින කිසිම බලපෑමක් නොමැත.

		35
	සටහන උ	
	103,049,662	103,049,662
	(187,311,108)	(187,311,108)
	(4,610,584)	(5,014,084)
	-	-
	-	-
	42,000,000	42,000,000
	187,311,108	187,311,108
	4,667,084	5,070,584
	145,106,162	145,106,162

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
(ආසන්නතම රුපියලට සකසන ලද සංඛ්‍යා)

	සටහන්	2022	2021 (නැවත ප්‍රකාශිත)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
වර්ෂය සඳහා සම්පූර්ණ අනිරික්තය		(85,552,337)	257,427,107
මුදල් නොවන අයිතම සඳහා ගැලපීම්			
පෙර වසරවලට අදාළව ගැලපීම්		817,560	1,559,985
ක්ෂය වීම්		223,412,635	187,269,094
දේපල, පිරියක සහ උපකරණ විකිණීමේ ලාභ		(44,285)	-
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂ කිරීම්		762,438	42,014
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන		(43,461,919)	(62,698,941)
කාරක ප්‍රාග්ධන ගැලපීම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් උත්පාදනය		**95,934,092**	**383,599,259**
කාරක ප්‍රාග්ධන ගැලපීම්			
තොග වැඩි වීම් / අඩුවීම්		(621,035)	(3,001,153)
ලැබිය යුතු මුදල් වැඩිවීම් / අඩුවීම්		(1,388,852)	(1,339,592)
කෙටි කාලීන ආයෝජනවල වැඩි වීම් / අඩුවීම්		2,905,996	(2,940,634)
පෙරගෙවුම් වැඩිවීම් / අඩුවීම්		(5,098,697)	(39,533,880)
අත්තිකාරම් වැඩි කිරීම් / අඩු කිරීම්		(31,030)	49,830
කාර්ය මණ්ඩල ණය වැඩි කිරීම් / අඩු කිරීම්		4,289,897	(2,114,700)
බාහිර පාර්ශවයන් වෙත වූ කැන්පතු වැඩිවීම් / අඩුවීම්		(530,102)	(131,887)
ගෙවිය යුතු අනෙකුත් දෑ වැඩි කිරීම් / අඩු කිරීම්		126,184,048	(12,241,562)
කැන්පතු සහ රඳවා තබාගැනීමේ වැඩිවීම් / අඩුවීම්		1,223,409	(18,509,527)
කෙටි කාලීන ප්‍රතිපාදන වැඩි කිරීම් / අඩුවීම්		112,000	1,188,000
උපචිත වියදම්වල වැඩි වීම් / අඩුවීම්		24,229,002	(21,849,660)
විලම්බිත ආදායම වැඩිවීම් / අඩුවීම්		(642,042)	1,923,933
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන මුදල්		**246,566,686**	**285,098,427**
ගෙවන ලද අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම් පිරිවැය		(30,264,488)	(10,371,015)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**216,302,198**	**274,727,412**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
දේපල, පිරියක සහ උපකරණ අත්පත් කර ගැනීම්		(1,128,900,112)	(47,858,051)
ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලැබෙන ආදායම්		167,540	-
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම්			(3,727,189)
කෙරිගෙන යන වැඩ ප්‍රාග්ධන කටයුතු අත්පත් කර ගැනීම් / (මාරු කිරීම්).		876,043,489	(244,925,585)
ප්‍රාග්ධන අත්තිකාරම් අත්පත් කර ගැනීම් / (මාරු කිරීම්).		-	54,717,794
ආයෝජන		(328,685)	1,043,383
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**(253,017,769)**	**(240,749,647)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
නිශ්චිත අරමුදල් වැඩි වීම් / අඩුවීම්		5,149,152	4,292,440
පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ අරමුදල වැඩි වීම් / අඩුවීම්		(74,485)	(20,200)
වි.හා ශ්‍ර.අ.කේන්ද්‍රයයේඅරමුදලේ වැඩි වීම් / අඩුවීම්		(936,848)	(488,338)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**4,137,819**	**3,783,902**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ අඩුවීම්		**(32,577,752)**	**37,761,667**
වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	12	55,353,929	17,592,262
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	12	**22,776,177**	**55,353,929**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති.

1. පොදු

1.1 වාර්තා කරණු ලබන ඒකකය.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයකි. ප්‍රධාන පරිපාලන කාර්යාලය සහ ප්‍රධාන මෙහෙයුම් පවත්වාගෙන යන ස්ථානය පිහිටුවා ඇත්තේ කොළඹ 7 ඇල්බට් වන්ද්‍රවංකයේ අංක 21 දරන ස්ථානයේය.

1.2 ප්‍රධාන කර්තව්‍යයන් සහ මෙහෙයුම් වල ස්වභාවය.

ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටමින් සෞන්දර්ය අධ්‍යයන ක්ෂේත්‍රයේ න්‍යායාත්මක හා ප්‍රායෝගික අංශයන්ගෙන් උසස් අධ්‍යාපනය ලබාදීම, එම ක්ෂේත්‍රයේ දැනුම හා හැකියාවන් අත් අයට ලබාදීම සහ එම ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතුවල නියැලීම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සාර්ථකව නිමකරන විද්‍යාර්ථයින්ට උපාධි සහ සහතිකපත් ප්‍රදානය කිරීම ද විශ්වවිද්‍යාලයේ තවත් එක් ප්‍රධාන කාර්යභාරයකි.

1.3. නිකුත් කිරීම සඳහා බලය දීමේ දිනය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2023 පෙබරවාරි මස 24 වන දින පාලක සභාවේ බලය ලැබී ඇත.

1.4 වාර්තාගත කාලච්ඡේදය.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාලච්ඡේදය 2021 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වේ.

2. සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අනුව අනුගත වේ. නමුදු ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත නොමැති අවස්ථා වලදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය සහ සටහන් වලින් සමන්විත වේ.

2.2 ගණනය කිරීමේ පදනම.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිලියෙල කර ඇත. දේපල පිරියත හා උපකරණ සාධාරණ අගය පදනම් කර ගණනය කිරීම හැර මූල්‍ය ප්‍රකාශනවලට උද්ධමන සාධක ගැලපීම් සිදුකර නොමැත.

2.3 සංසංදනාත්මක සැසඳීම

ප්‍රවර්තන වර්ෂයේ වටිනාකම් ඉදිරිපත් කිරීමේදී විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරන ලද සියළුම ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූල වේ. අවශ්‍ය අවස්ථාවලදී සැසඳුම් අගයන් ප්‍රවර්තන වර්ෂයේ වෙනස්වීම් වලට ගලපා ඉදිරිපත් කර ඇත.

2.4 ප්‍රමාණාත්මක බව

සෑම ප්‍රමාණාත්මක හා සමාන අයිතම මූල්‍ය ප්‍රකාශන වල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. ප්‍රමාණාත්මක නොවන්නේ නම් හා එක සමාන නොවන ස්වභාවයේ අයිතම වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

2.5 හිලව් කිරීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත මගින් අවසරය දී ඇත්නම් මිස වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලවිකර කපා හැර නොමැත.

2.6 අඛණ්ඩ පැවැත්ම

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට අඛණ්ඩ පැවැත්මක් ඇති බව සැලකිල්ලට ගෙන ඇත. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පාලක සභාවට අපේක්ෂා කල හැකි ඉදිරි අනාගතයක් සඳහා ප්‍රමාණවත් සම්පත් පවතින බවට සාධාරණ අපේක්ෂාවක් ඇත. අනාගතය පිළිබඳ ඇති සියළු තොරතුරු සැලකිල්ලට ගනිමින් විශ්වවිද්‍යාලය ඇවරකිරීමක්, මෙහෙයුම් නවතා දැමීමක් පුරෝකථනය නොකරයි. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මක් ඇත යන පදනම අනුගමනය කර ඇත.

2.7 ගිණුම්කරණ කාලච්ඡේදයෙන් පසු සිදුවීම්

ගිණුම්කරණ කාලච්ඡේදයට පසුව ඇති සියළුම ද්‍රව්‍යමය සිදුවීම් සලකා බලා ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය අවසථාවන් හිදී සුදුසු ගැලපීම් හා අනාවරණය කිරීම් සිදුකර ඇත.

2.8 ක්‍රියාකාරී හා වාර්තාකරණ මුදල් ඒකකය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර ඇති අයිතම මනිනු ලබන්නේ විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වන ආර්ථික පරිසරයේ භාවිතාකරන මුදල් වලිනි (ව්‍යවහාරික මුදල්) මෙම මූල්‍ය ප්‍රකාශන විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී හා වාර්ථාකරණ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් යකස් කර ඉදිරිපත් කර ඇත.

2.9 විදේශ විනිමය වලින් කරන ලද ගනුදෙනු සහ ශේෂයන්

විදේශ විනිමය මගින් කරන ලද ගනුදෙනු දිනයන්හිදී පැවති විනිමය අනුපාත භාවිතා කරමින් ව්‍යවහාරික මුදල් බවට පරිවර්තනය කර ඇත. එවැනි ගනුදෙනු නිරවුල් කිරීම මගින් ලැබෙන ලාභ සහ පාඩු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වාර්තා කර ඇත.

2.10 ආසන්න අගයට වැටයීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත මගින් අවසරය දී ඇති පරිදි වෙනත් අකාරයකින් දක්වා නොමැතිනම් මූල්‍ය ප්‍රකාශනවල ඇති මුදල් ආසන්නම රුපියලට වටයා ඇත.

2.11.1 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ එහි පිරිවැය හෝ ප්‍රත්‍යාගණිත අගයෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරන පාඩු අඩුකල අගයට පෙන්වා ඇත. පහත සඳහන් අනුපාතයන්ට අනුව සරල මාර්ග ක්‍රමයට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 1995.10.05 දින දරණ වක්‍රලේඛ අංක 649 ට අනුව ක්ෂය කරනු ලැබේ.

වත්කම් ප්‍රභේදය	ක්ෂය අනුපාතය
ගොඩනැගිලි	5%
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	10%
යන්ත්‍ර සහ පිරියත	10%
කාර්යාල උපකරණ	20%
පුස්තකාල පොත් හා වාරසඟරා	20%
මෝටර් වාහන	20%
විද්‍යුගාර හා ඉගැන්වීමේ උපකරණ (ක්‍රීඩා භාණ්ඩ ඇතුලුව)	20%
උපාධි ලෝගු හා රංගවස්ත්‍රාභරණ	20%

ක්‍රීඩා උපකරණ ආරම්භයේ සිට කාර්යාල උපකරණ ලෙජර ගිණුම යටතේ ගිණුම්ගත කර ඇති අතර ඉහත සඳහන් පරිදි ක්ෂය වීම කාර්යාල උපකරණවලින් 20% ක ක්ෂයවීම් අනුපාතිකය මත ක්ෂය ගණනය කිරීම සිදු කරන ලදී. කෙසේ වෙතත් 2016 වසරේ සිට ක්‍රීඩා උපකරණ ප්‍රමාණය තොරතුරු භාවිතයේ පහසුව සඳහා වෙනම ලෙජර ගිණුමක වාර්තා වී ඇති අතර ක්‍රීඩා උපකරණ සඳහා ක්ෂයවීම් අනුපාතිකයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛ 649 යටතේ ලබා නොදීම නිසා කාර්යාල උපකරණ 20% ක අනුපාතය යටතේ ක්ෂය වී ඇත. (1995.10.05 දින වක්‍රලේඛ අංක 649.)

2.11.2 දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම

දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති සමහර අයිතම අගයන් 2010.06.30 දිනට ප්‍රත්‍යාගණිත අගයට වේ.

ඉඩම් හා ගොඩනැගිලි

සියළු ඉඩම් ප්‍රත්‍යාගණිත වටිනාකම් යටතේ දක්වා ඇත. වසර 10ට වැඩි සියළු ගොඩනැගිලි 2010.06.30 දිනට ප්‍රත්‍යගණිත වටිනාකම් යටතේ දක්වා ඇත. ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ ලියාපදිංචි තක්සේරුකරුවකු විසින් මෙම ප්‍රත්‍යගණනය කර ඇත. සාධාරණ අගය වෙළඳපල වටිනාකම මත තීරණය කර ඇත.

නේවාසිකාගාර 2ක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ආධාර ලෙස විශ්වවිද්‍යාලය වෙත ලබාදෙන ලදී. මෙම වටිනාකම 2017 නොවැ.01 දින සිට ක්‍රමක්ෂය කිරීමට පටන්ගෙන ඇත.

දෘශ්‍ය කලා පීඨය සඳහා ගොඩනැගිලි හා බිම් සැලසුම්කරණය සහ සංගීත පීඨ ගොඩනැඟිල්ල හා පොදු පහසුකම් ගොඩනැගිල්ල 2021.12.15 සහ 31.03.2022 යන දිනවලදී පිළිවලින් අවසන් කර ඇති අතර දැනට එම ගොඩනැඟිලි භාවිත කරමින් පවතී. පහත මුළු ඉදිකිරීම් පිරිවැය 2022 වෂර්යේ ප්‍රාග්ධන වැඩ කරමින් පවතින ප්‍රාග්ධන වත්කම් ගිණුමෙන් අදාල වත්කම් ගිණුමට මාරු කර දේපල, පිරියත සහ උපකරණ යටතේ ක්ෂය වී ඇත. (PPE - සටහන 10)

	රුපියල්.
දෘශ්‍ය කලා පීඨය සඳහා ගොඩනැගිලි හා බිම් සැලසුම්කරණය	404,320,716.00
සංගීත පීඨය සහ පොදු පහසුකම් සඳහා ගොඩනැඟිල්ල	565,651,995.00
මුළු පිරිවැය	969,972,712.00

2022.12.31 දිනට ඉහත ගොඩනැගිලි සඳහා හිඟ ගෙවීම් රුපියල් 124,079,264.99 ප්‍රාග්ධනීකරණය කර ඇත. තවද නොගෙවූ ගෙවීම් සඳහා පොලී හිමිකම් පැමේ අවිනිශ්චිත වගකීමක් ඇත, ගෙවීම් සිදු කරන විට ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ.

පොත්පත් හා වාර සහරා

2005.12.31 දිනට ප්‍රථම මිල දී ගත් පොත් පත් හා වාර සහරා ප්‍රත්‍යගණිත වටිනාකම් යටතේ දක්වා ඇත. ප්‍රත්‍යගණනය කරනු ලැබ ඇත්තේ පහත සඳහන් පදනම් අනුව වේ.

පොත් පත් මිල දී ගත් කාල පරාසය	ප්‍රත්‍යගණන පදනම්
01-01-1979 -31-12-2005	80%
01-01-1990 -31-12-1998	70%
1989-12-31 පෙර	60%

සුදුසුකම් ලත් ස්වාධීන උපදේශකවරයෙක් හා වරලත් ගණකාධිකාරිවරයෙක් එක් ව මෙම කාර්යය කරනු ලැබ ඇත.

ලී බඩු සහ සවි කිරීම් පිරියත හා යන්ත්‍ර උපකරණ

පිරිවැය හඳුනාගත හැකි අවස්ථාවල ලී බඩු සහ සවි කිරීම් පිරියත හා යන්ත්‍ර උපකරණ පහත සඳහන් පදනම්ට අනුව ප්‍රත්‍යගණනය කරනු ලැබ ඇත.

මිල දී ගත් කාල පරාසය	ප්‍රත්‍යගණන පදනම්
1991-01-01 සිට 31-12-2000	80%
31-12-1990 ට පෙර	60%

කාර්යාල උපකරණ , විදුලිභාර හා ඉගැන්වීම් උපකරණ , උපාධි ලේඛ සහ රංග වස්ත්‍ර

කාර්යාල උපකරණ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණ සහ උපාධි ලේඛ හා රංග වස්ත්‍ර පිරිවැය හඳුනාගත හැකි අවස්ථාවල පහත සඳහන් පදනමට අනුව ප්‍රත්‍යාගණනය කරනු ලැබ ඇත.

මිල දී ගත් කාල පරාසය	ප්‍රත්‍යාගණන පදනම
1996-01-01 සිට 2005-12-31	75%
2005-12-31 ට පූර්ව	50%

පිරිවැය හඳුනාගත නොහැකි කාර්යාල උපකරණ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික උපකරණ සහ උපාධි ලේඛ සහ රංග වස්ත්‍ර ඇස්තමේන්තු ගත ශුද්ධ උපලබ්ධි වටිනාකම් අනුව සාධාරණ අගය මත ප්‍රත්‍යාගණනය කර ඇත. මෙම කාර්යය වරලත් ගණකාධිකාරිවරයෙකු සහ සුදුසුකම්ලත් ස්වාධීන උපදේශකවරයෙකු විසින් ඒකාබද්ධව කරනු ලැබ ඇත.

මෝටර් වාහන

සියලුම මෝටර් වාහන 2018.01.01 දිනට ප්‍රත්‍යාගණනය කරන ලද අගය වන රු. 27,400,000.00 ලෙස දක්වා තිබේ. සාධාරණ වටිනාකම තක්සේරු කර ඇත්තේ වෙළඳපල වටිනාකම හා භෞතික පිරික්සුම පදනම් කර ගනිමිනි. සිලෝන් මෝටොබයිල් ඇසෝසියේශන් (ලංකා මෝටර් රථ සංගමය) විසින් ප්‍රත්‍යාගණනය සිදු කරන ලදී.
අංක WP KJ – 3863 දරන ටොයොටා ලැන්ඩ් ක්‍රෘස ප්‍රාඩෝ (2010) ජීප් රථය පරිත්‍යාගයක් ලෙස මුදල් සහ ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය වෙතින් ලැබී තිබුණි. පාලක සභාව මෙම රථය සෞන්දයර් කලා විශ්වවිද්‍යාලය වෙත පැවරීම අනුමත කළ අතර එය විශ්වවිද්‍යාලීය ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කරන ලදී. ඒ අනුව මෝටොබයිල් ඇසෝසියේශන් ඔෆ් සිලෝන් (ලංකාවේ මෝටර් රථ සංගමය) විසින් ප්‍රත්‍යාගණනය සිදු කරන ලදී. මෙම රථයේ අළුත්වැඩියා පිරිවැයද ඇතුළත් කරමින් එහි අගය රු. 11,580,089.37 ක් වශයෙන් ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් කර ඇත.

2.11.3 සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් (ශූන්‍ය වටිනාකමැති වත්කම්)

වත්කමක අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ආයුකාලය යටත් පිරිසෙයින් එක් එක් වාර්ෂික වාතර්ා කිරීම දිනයේදී සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, අපේක්ෂණයන් පෙර ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම්, අදාළ වෙනස්කම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2011/03 හා 2014/03 මඟින් විශ්වවිද්‍යාල පද්ධතියට අදාල කරන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් (SLPSAS) හි ප්‍රමිති අංක 7 හි ඡේද අංක 65 ප්‍රකාරව, ප්‍රමිති අංක 3-"ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් හා දෝෂ" අනුකූලව, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනසක් ලෙස දැක්විය යුතුය. විගණකාධිපතිවරයාගේ විස්තරාත්මක විගණන වාතර්ාවේ ඡේද අංක 1.4.2-"ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති" යන කොටසෙහි සඳහන් කර ඇති අයුරින්, එම ප්‍රමිතිය ප්‍රකාරව, දැනට භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය වාෂිකව තක්සේරු නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස, ජංගම නොවන වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලයේ ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් මත ඇස්තමේන්තු දෝෂයක් ඇති වී තිබේ.
ඒ අනුව, ශූන්‍ය අගය සහිත ඒවාද ඇතුළු ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය ආරම්භ කරන ලද අතර 2022.12.31 දින වන විටත් ක්‍රියාත්මකව පැවතුණි. ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කෙරෙමින් පවතින බැවින්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) අංක 7 හි 91 ඡේදය ප්‍රකාරව 2022.12.31 දිනට රු. 584,598,522.86 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද ස්ථාවර වත්කම්වල සාරාංශයක් පහත අනාවරණය කෙරේ (ශූන්‍ය වටිනාකමැති වත්කම්වල විස්තරාත්මක ලැයිස්තුවක් පරිශිෂ්ට තුළ දී තිබේ)

ප්‍රභේද අංකය	වත්කම් ප්‍රභේදය	මුල් පිරිවැය රුපියල්
3	කාර්යාලීය උපකරණ	158,139,256.14
4	පිරියත හා යන්ත්‍රෝපකරණ	1,914,107.90
5	විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ	293,507,144.07
6	ගෘහභාණ්ඩ හා සවිකිරීම්	58,997,102.82
7	පුස්තකාල ග්‍රන්ථ	49,684,265.53
9	ක්‍රීඩා භාණ්ඩ	5,148,267.00
14	උපාධි ලෝගු සහ වස්ත්‍රාභරණ	17,208,379.40
	එකතුව	**584,598,522.86**

2.11.4 2015, 2016 හා 2017 වර්ෂයන්හිදී ශූන්‍ය වටිණාකමැති වත්කම් සඳහා කරන ලද රු. 16,157,917.84 ක් වූ ක්ෂය අධි-ප්‍රතිපාදනය 2018 වර්ෂයේ ගිණුම් පොත් තුළ පහත පරිදි ගැලපුම් කර තිබේ:-

වත්කම් ප්‍රභේදය	ක්ෂය (රුපියල්)
විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ	10,760,353.72
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	805,316.93
පුස්තකාල ග්‍රන්ථ හා වාර සඟරා	874,428.14
පිරියත හා යන්ත්‍රෝපකරණ	21,995.45
ගොඩනැගිලි	194,260.66
උපාධි ලෝගු සහ වස්ත්‍රාභරණ	1,205,076.96
කාර්යාලීය උපකරණ	2,296,486.10
	16,157,917.84

ස්ථාවර වත්කම් ලේඛනය පරිගණකගත පැකේජ දෙකක් තුළ පවත්වා ගෙන ගොස් තිබේ. ස්ථාවර වත්කම් දත්ත 2015 වර්ෂය දක්වා එක් පැකේජයක් (පැරණි පැකේජය) තුළද, 2016 වර්ෂයේ සිට ඉදිරියට නව පැකේජය තුළද ලේඛනගත කර ඇත. පැරණි පැකේජයේ සියලුම දත්ත 2018 වර්ෂය තුළ නව පැකේජයට අන්තඃග්‍රහණය කර ඇති අතර පැකේජය පැරණිතම මිලදී ගත් දිනයේ සිට ක්‍රියාත්මක කර ඇත. මෙයද ඉහත සඳහන් කරන ලද ක්ෂය අධි-ප්‍රතිපාදනය සඳහා බලපෑම් ඇති වී තිබේ.

2.11.5 ක්‍රීඩා භාණ්ඩවල පිරිවැයෙහි වටිණාකම වන රු. 714,167.00 ක අගය 'කාර්යාලීය උපකරණ' වෙතින් 'ක්‍රීඩා භාණ්ඩ' වෙත මාරු කරනු ලැබූ අතර, ක්‍රීඩා භාණ්ඩවල සමුච්චිත ක්ෂය 'කාර්යාලීය උපකරණවල සමුච්චිත ක්ෂය' වෙතින් 'ක්‍රීඩා භාණ්ඩවල සමුච්චිත වටිණාකම' වෙත මාරු කරන ලදී.

2.11.6 <u>කොහුවල පරිශ්‍රය</u>

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල ට අයත් කොහුවල පිහිටි පරිශ්‍රයක් තාවකාලිකව සිය අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම සඳහා භාවිතයට ගනිමින් සිටී. මෙම විශ්වවිද්‍යාලයේ පවත්නා ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් එසේ කරනු ලබයි. මෙම තත්වය යටතේ මෙම පරිශ්‍රයේ වටිනාකම විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශ වල දක්වා නොමැත.

කොහුවල පරිශ්‍රය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පැවරීමට නියමිත බැවින් 2022 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නඩත්තු හා නාට්‍ය පීඨය සඳහා දෙහිවල නව ගොඩනැගිල්ලක් කුලියට ගෙන ඇත.

2.12 කෙරිගෙන යන වැඩ (ප්‍රාග්ධන)

වාර්තා කරන දිනට සම්පූර්ණ නොකරන ලද දේපල පිරියත හා උපකරණ සඳහා වන ප්‍රාග්ධන වියදම් කෙරිගෙන යන වැඩ මූලධන ලෙස දැක්වේ. කෙරිගෙන යන වැඩ මත දරන ලද පිරිවැය භාවිතයට ගන්නා විට දේපල පිරියත හා උපකරණ වෙත මාරු කරනු ලැබේ.

මුළු ඉදිකිරීම් වියදම රු.969,972,712.00 ක් 2022 වෂර්යේ ප්‍රාග්ධන වැඩ කරමින් පවතින ගිණුමෙන් ගොඩනැගිලි වත්කම් ගිණුමට මාරු කරන ලදී.

2021 වෂර්යේදී වැරදි ලෙස වාර්තා කර ඇති ප්‍රාග්ධන වැඩ කරමින් පවතින ගිණුමෙන් පහත අයිතම සඳහා අදාළ රුපියල් 23,286,880.00 සම්පූර්ණ මුදල ඉවත් කර 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ප්‍රතිවාර්ථා (Restate) කිරීම සිදු කර ඇත.

ඊ-කළමනාකරණ පද්ධතිය සංවර්ධනය	10,789,000.00
යටිතල පහසුකම් අථත්‍යකරණය සහ උපස්ථ ක්‍රියාත්මක කිරීම	10,982,953.00
IT Lab Horton වෙත මූලික ජාල උපකරණ	1,514,925.87
මුළු	23,286,880.00

2.13 අස්පෘශ්‍ය වත්කම්

පිරිවැය නිශ්චිතව මැනිය හැකි පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ඇත. අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කර දක්වනු ලැබේ. මෙම පිරිවැය ඵලදායී ජීව කාලය තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.14 මූල්‍ය වත්කම්

ආයෝජන

ස්ථාවර තැන්පතු ආයෝජන මගින් නිරූපනය කරයි. මෙම ආයෝජනයන් "ආයෝජන" මූල්‍ය වාර්තා කරන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 09 ට අනුව ගිණුම්ගතකර ඇත.

2.15 ජංගම වත්කම්

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වර්ගීකරණය කර ඇති ජංගම වත්කම් යනු විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල වර්ෂය තුලදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන හෝ උපයෝජනය වෙතැයි අපේක්ෂා කරන ඒවා වන අතර, වාර්තා කරන දිනයේ සිට මාස දෙළහක් තුල පියවන පියවීම් වේ.

2.16 තොග

ඉන්වෙන්ට්‍රි පිරිවැය ප්‍රකාශ කර ඇති අතර පළමුවෙන් ඇතුල්වෙන අයිතම පළමුවෙන් පිටතට (FIFO) පදනම මත තීරණය වේ. ඉන්වෙන්ට්‍රි ප්‍රධාන වශයෙන් ලිපි ද්‍රව්‍ය සහ අමතර කොටස් වලින් සමන්විත වේ. ඉන්වෙන්ට්‍රි ඇත්තේ පරිභෝජනය සඳහා මිස නැවත විකිණීම සඳහා නොවේ.

ඉන්වෙන්ටරි අයිතමවල සෙමින් වලනය වන අයිතම (උදා: පොත්) රු. 1,092,714.11 ක් සහ වලනය නොවන අයිතම රු. 67,066.68 ක් ඇතුළත් වේ. මූල්‍ය රෙගුලාසි අංක 102 සහ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 9 ට අනුව ප්‍රධාන ගබඩාවල ප්‍රකාශනවලින් වටිනාකම අඩු කිරීමේ හෝ පාඩු සිදුවීමේ සම්භාවිතාවක් නොමැති බැවින්, ප්‍රතිපාදන කිසිවක් සිදු කර නොමැත.
නඩත්තු අංශයේ ඉන්වෙන්ටරි වෙන වෙනම ගණනය කෙරේ.
VAPA විශ්වවිද්‍යාල මුද්‍රණාලයේ පොත් තොගය මිල වටිනාකමට අනුව ඉන්වෙන්ටරියේ ඇතුළත් වේ. VAPA විශ්වවිද්‍යාල මුද්‍රණාලයේ පොත් තබාගෙන සිටින්නේ විකුණා මුදල් ඉපයීමේ අරමුණින්ය.

2.17 සේවකයන්ට ලබා දුන් අත්තිකාරම් හා ලැබිය යුතු දේ.

සේවකයන්ට ලබාදුන් අත්තිකාරම් හා ලැබිය යුතු ශේෂය උත්සව අත්තිකාරම් හා පොත් සඳහා වන දීමනාවෙන් සමන්විත වේ.

2.18 මුදල් හා මුදල් සමාන දේ.

මුදල් හා මුදල් සමාන දේ මගින් නිරූපණය වන්නේ ජංගම ගිණුම් ශේෂය සහ ඉතිරි කිරීමේ ගිණුම් වල ශේෂයන් වේ. අතේ ඇති මුදල්, හා කෙටිකාලීන ඉහළ ද්‍රවශීලී ආයෝජන එනම් පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කල හැකි වටිනාකම සුළු අවධානමකට යටත් දෑ වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා මුදල් හා මුදල් සමාන දෑ යන්නට අතැති මුදල් හා බැංකුවේ ඇති තැන්පතු ද අදල වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කරනු ලබන්නේ වක්‍ර ක්‍රමය මත පදනම්වය.

2.19 සේවක ප්‍රතිලාභ

පාරිතෝෂික සඳහා වෙන් කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක LKAS 19 පරිදි වසරක සේවා කාලයක් සම්පූර්ණ කරන සියළු සේවක හවතුන් වෙනුවෙන් විශ්‍රාමික පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. මෙම වෙන් කිරීම් බාහිර අරමුදලක ආයෝජනය කර නොමැත.

2019.06.01 දින සිට බලපැවැත්වෙන පරිදි නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ 05/2019 අනුව පාරිතෝෂික වෙන්කිරීම් පසුගිය වසර වලට සාපේක්ෂව විශාල ලෙස ඉහළ ගොස් තිබේ. ඒ අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ගෙවනු ලබන අධ්‍යයන දීමනාව සහ විශ්වවිද්‍යාල පද්ධතියේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන මාසික වන්දි දීමනාව (MCA) පාරිතෝෂික වෙන් කිරීම් ගණනය කිරීම සඳහා සලකා බලන ලදී.

පාරිතෝෂික ප්‍රතිපාදන ගණනය කිරීම සඳහා ගලපන ලද වට්ටම් අනුපාතය සලකා බලා ඇති අතර, ගලපන ලද වට්ටම් අනුපාතය ලබා ගැනීම සඳහා බැඳුම්කර ප්‍රතිලාභය ගෙවීම රට විසින් පැහැර හැරීම ගලපා ඇත.

2.20 වගකීම් සහ වෙන්කිරීම්

ජංගම වගකීම්

ජංගම වගකීම් ඒවායේ පොත් අගයට සඳහන් කර ඇත.

වෙන් කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලයට ඇති වර්තමාන බැඳීම් (නෛතික) පවතින අවස්ථාවන්හිදී වෙන් කිරීම් හඳුනාගෙන වාර්ථා කර ඇත.

අවිනිශ්චිත වගකීම් හා අවිනිශ්චිත වත්කම්

අවිනිශ්චිත වගකීමක් යනු ක්‍රියාදමයේ පාලනයෙන් ඔබ්බට ගිය අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් මත සිදුවන සිදුවීම හඳුනා නොගත් වර්තමාන වගකීම් වන අතීත සිදුවීම් වලින් පැනනැගිය හැකි සිදුවීමකි. වගකීම පියවීම සඳහා සම්පත් ගලා යාමක් අවශ්‍ය වනු ඇත.

නිශ්චිතව මැනිය නොහැකි වගකීම් ඇති අවස්ථාවන්හිදී අවිනිශ්චිත වගකීමක් ලෙස හඳුනා නොගන්නා අතර මූල්‍ය ප්‍රකාශනයේ එහි පැවැත්ම හෙලිදරව් කරයි.

අවිනිශ්චිත වත්කමක් යනු විශ්වවිද්‍යාල පාලනයෙන් ඔබ්බට ගිය අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් සිදුවීම හෝ සිදුවීම් වලින් පැන නැගිය හැකි වත්කමකි. විශ්වවිද්‍යාලයේ අවිනිශ්චිත වත්කම් හඳුනා නොගන්නා අතර, නිශ්චිත නොවන එහි පැවැත්ම අනාවරණය කරයි.

2.21 ආදායම් හඳුනාගැනීම

රජයේ පුනරාවර්ථන ආධාර මුදල් පදනම් මත ගිණුම් ගත කෙරේ. ශිෂ්‍යයින් ගෙන් අය කරනු ලබන පාඨමාලා ගාස්තු ඒවා එකතු කරන අවස්ථාවේ දී ගිණුම් ගත කෙරේ. ආයෝජන කටයුතු මත ආදායම් උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත. ස්වයං මූල්‍ය පදනම මත පවත්වාගෙන යනු ලබන පාඨමාලා වෙනුවෙන් ශිෂ්‍යයන්ගෙන් අයකරනු ලබන පාඨමාලා ගාස්තු අදල පරිදි මූල්‍ය ප්‍රකාශ වල පාඨමාලා කාලය පදනම් කර ගෙන විලම්භනය කරනු ලැබේ.

මූල්‍ය ආදායම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත නොමැතිවීම හේතුවෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 අනුව පොලී අනුපාතය භාවිතා කරමින් පොළී ආදායම උපචිත පදනම මත හඳුනා ගැනේ.

2.22 වියදම් හඳුනා ගැනීම

මූල්‍ය කාර්යසාධන වාර්තාවේ දැක්වෙන වියදම් එකී වියදම් වල ස්වභාවය පදනම් කරගෙන වෙන වෙනම දක්වා ඇත. වසරේ අතිරික්තය ගණනය කිරීමේ දී ප්‍රථම උපාධි අපේක්ෂකයින් වෙනුවෙන් දරණ ලද සියළු වියදම් රජයේ පුනරාවර්ථන ආධාර වලින් අවුකර පෙන්වා ඇත.

2.23 විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය (CODL)

විශ්ව විද්‍යාලය "විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය - CODL" නමින් හැඳින්වෙන වෙනම ඒකකයක් ස්වයං මූල්‍ය පදනමක් මත පවත්වාගෙන යයි. මෙම ඒකකය සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන අතර ඉන් අනතුරුව ඒවා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කෙරේ.
කොමිෂන් සභා චක්‍රලේඛ 932 අනුව, CODL අරමුදල භාවිතා කිරීම සඳහා CODL විසින් අනුරූ ව්‍යවස්ථාවක් සකස් කර ඇත. ඒ සඳහා අරමුදල් වියදම් ප්‍රමාණය අරමුදල් ආදායම් ගිණුමට මාරු කරනු ලැබේ. වසර තුළ අරමුදල් වියදම් රු. 488,338.00 කි

ප්‍රධාන වශයෙන් මෙම වැඩසටහන්හි ප්‍රායෝගික නැඹුරු ක්‍රියාකාරකම් ඇතුළත් වේ. වසංගත තත්ත්වය හේතුවෙන් අධ්‍යයන කටයුතු (විභාග සහ ඉගැන්වීම්) කිරීමට නොහැකි විය. සිසුන් විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීමට සුදුසු තත්ත්වයට පත්වීමෙන් පසු මේ සියලු කටයුතු සිදු කළ යුතු වේ. ඒ නිසා සියලු ආදායම විලම්බිත කර ඇත්තේ දරන ලද වියදම් අඩු කිරීමෙන් පසුවය.වියදම් රු. 936,848.00 කි.

CODL හි ආදායම පහත පරිදි කාල පදනම් අනුව වෙනස් වී ඇත. (පාඨමාලාව 2023 දී සම්පූර්ණ කිරීමට අවශ්‍ය මාස ගණන)

	පාඨමාලාව. ඇදීම 2019/20 (2)	නැවුම් 2020/21 පාඨමාලාව	සංගීතය 2020/21 පාඨමාලාව	ඇදීම 2022/2023	උපාධිය/ නැවත නැවත විභාගය	එකතුව
වෙනස් ආදායම ඉ/ගෙ	1,680,000	1,263,878	1,145,001	2,453	-	4,091,332
වසර සඳහා පාඨමාලා ආදායම	624,000	830,000	244,000	2,610,080	510,000	4,818,080
එකතුව	2,304,000	2,093,878	1,389,001	2,612,533	510,000	8,909,412
කල් දැමූ ආදායම	**576,000**	**872,449**	**578,750**	**1,959,400**	**510,000**	**4,496,599**
		මාස 3ක් ඉදිරියෙන්	මාස 5 ක් ඉදිරියෙන්	මාස 9ක් ඉදිරියෙන්	විභාග පැවැත්වුයේ නැත	

මහා භාණ්ඩාගාරය විසින් අපේක්ෂිත පුනරාවර්තන ප්‍රදාන නිකුත් කර නොතිබීම නිසා නොවැළැක්විය හැකි පුනරාවර්තන වියදම් දැරීමට විශ්වවිද්‍යාලය CODL වෙතින් රුපියල් මිලියන 10ක් ආපසු ගෙවීමේ කොන්දේසියක් මත ලබාගෙන ඇත. ඉහත ණයට ගත් මුදලින් රුපියල් මිලියන 2 ක් 2022.12.31 දින CODL වෙත ගෙවා ඇත. කෙසේ වෙතත්, මෙම ආපසු ගෙවීම CODL ගිණුම් පොත්වල සකස් කර නොමැත.

2.24 <u>පශ්චාද් උපාධි අධ්‍යයන ඒකකය</u>

ස්වයං මූල්‍ය පදනම් මත පශ්චාද් උපාධි අධ්‍යයන ඒකකය වශයෙන් වෙනම ඒකකයක් විශ්වවිද්‍යාලය මඟින් පවත්වාගෙන යනු ලැබේ. මෙම ඒකකය වෙනුවෙන් වෙනම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර පසුව එය විශ්වවිද්‍යාලයේ සමස්ත මූල්‍ය ප්‍රකාශ හා ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශවල පෙන්වා ඇත.

2.25 <u>මූලධන / සංවර්ධන ආධාර යටතේ ලද විශේෂ ආධාර ගිණුම්ගත කිරීම.</u>

මහා භාණ්ඩාගාරයෙන් විශේෂ ව්‍යාපෘති සඳහා ලැබෙන මූලධන මූල්‍ය ප්‍රතිපාදන ප්‍රථමයෙන් වැය නොවූ මූලධන ආධාර යටතේ ගිණුම් ගත කෙරේ. මෙම මුදල් පුනරාවර්තන ස්වභාවයේ කටයුතු සඳහා වැය කරන විට එම මුදල් මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ පුනරාවර්තන වියදම් සේ දක්වනු ලබයි.

2.26 ස්ථාවර වත්කම් ප්‍රතිස්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා ලැබෙන මූලධන ආධාර ගිණුම් ගත කිරීම.

මූලධන වියදම් සේ සැලකිය හැකි වියදම් පමණක් ප්‍රාග්ධනීත කරනු ලබන අතර අනෙකුත් වියදම් මූල්‍ය කාර්ය සාධක වාර්තාවේ වියදම් ලෙස දක්වා ඇත.

2.27 සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ හෙලිදරව් කිරීම.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මග පෙන්වීම යටතේ ප්‍රතිපත්තියක් ලෙස විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ජාල පහසුකම් LEARN ආයතනයෙන් ලබා ගනිමින් පවතී.

අප විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක වන අයි.ඒ.කේ.සී. සමරසිංහ මහත්මිය LEARN සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස කටයුතු කරමින් සිටී.එම කථිකාචාර්යවරිය විසින් මෙම සමාගමට සපයන සේවය වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් හෝ එම සමාගම විසින් කිසිදු පාරිශ්‍රමිකයක් ගෙවනු නොලැබේ.

2.28 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 (SLPSAS 2) ට අනුකූලව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇති අතර එමගින් මෙහෙයුම් ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම් හා ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් ලැබීම් හා ගෙවීම් නිරූපනය වේ. මුදල් හා මුදල් සමාන දෑ යන්නට ජංගම ගිණුම් හා ඉතිරිකිරීමේ ගිණුම් වල ශේෂයන් ඇතුලත් වේ.

2.29 ඉඩම් අයිතිය පිළිබඳ විස්තර

ඉඩම	වත්මන් තත්වය
අංක 21 ඇල්බට් චන්ද්‍රවංකය	2017 අප්‍රේල් මස 27 වන දින, රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 06 වන කොටස යටතේ, ප්‍රදාන අංක 4/10/41274 යටතේ විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගෙන ඇත.
අංක 21/1 ඇල්බට් චන්ද්‍රවංකය	2013 නොවැම්බර් 19 වන දින රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 06 වන කොටස යටතේ, ප්‍රදාන අංක 4/3/9908 යටතේ විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගෙන ඇත.
අංක 46, හෝර්ටන් පෙදෙස	රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 06 වන කොටස යටතේ විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ.
අංක 146 අනගාරික ධර්මපාල මාවත,දෙහිවල	රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 06 වන කොටස යටතේ විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ.
අංක 137 වලව්වත්ත,රාජගිරිය	රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 06 වන කොටස යටතේ විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ.

2.30

ගිවිසුම් කඩකිරීම පිළිබඳ විස්තර

නම: එස්. එම්. කෝට්ටෙගොඩ මහතා

අයකරගත යුතු මුදල: රු. 1,953,638.96
වත්මන් තත්ත්වය: බෙරුමකරණය 2020.09.29 දින දැනුම් දී ඇති අතර විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් ආපසු ගෙවා ඇත. බැඳුම්කර වටිනාකම වාරික 48 කින් ගෙවා නිම කිරීමට පාලක සභාව අනුමත කර ඇති අතර පියවීම් ගිවිසුමට අනුව 2022 ජූනි මාසයේ සිට මාසික වාරික ගෙවනු ලැබේ.

නම: පී.කේ.ඩබ්.එම්. විජේගුණසේකර මිය

අයකරගත යුතු මුදල: රු.1,271,568.00
අර්ථසාධක අරමුදල් ශේෂය: රු. 148,438.31 කි
වත්මන් තත්ත්වය: ප්‍රධාන ණයගැතියාට සහ ඇපකරුවන්ට එරෙහිව කොළඹ දිසා අධිකරණයේ අංක DMR/1853/2019 සහ DMR/1852/2019 යටතේ නඩු පවරා ඇත. ප්‍රධාන ණයගැතියා විසින් බෙරුම් කිරීම යෝජනා කර අනුමැතිය සඳහා 2020.12.17 දින පැවති 178 වැනි විශ්වවිද්‍යාල පාලක සභාව වෙත යොමු කර ඇත. කාර්යය ඉදිරියට කෙරෙමින් පවතී.

2022 වෂර්ය තුළ රුපියල් 1,700,034.21ක් අයකරගෙන ඇත.

2.31 වෙනත්

2.31.01 VAPA විශ්වවිද්‍යාල මුද්‍රණාලය

180 වැනි විශ්වවිද්‍යාල පාලක සභා රැස්වීම් අනුමැතිය ඇතිව ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක කෘති මුද්‍රිත පොත් ප්‍රකාශයට පත් කිරීම සඳහා "VAPA විශ්වවිද්‍යාල මුද්‍රණාලය" නමින් වෙනම ඒකකයක් 2021 දී ස්ථාපිත කර ඇත. VAPA විශ්වවිද්‍යාල මුද්‍රණාලය මගින් පොත් එකොලහක් මුද්‍රණය කර ඇති අතර මුද්‍රිත පොත් තොග විශ්වවිද්‍යාල ගබඩා වෙත ලැබී ඇත. ගණුදෙණු "VAPA මුද්‍රණාලය" ගිණුමේ සටහන් කර ඇති අතර මුද්‍රිත පොත්වල ශේෂය ඉන්වෙන්ටරිය යටතේ පෙන්වා ඇත (රු. 1,863,043.31). VAPA විශ්ව විද්‍යාල මුද්‍රණාලයේ ගණුදෙණු 2022 වර්ෂයේදී වාර්තා කිරීමට සැලසුම් කර තිබුණද, 2023 වසරේ වෙනම ගිණුම් පොත්වල සටහන් කර ඇත.

2.31.02 VAPA රූපවාහිනී

"VAPA රූපවාහිනී " නාලිකාව 2022 දී පාලක සභාවේ අනුමැතිය ඇතිව ආරම්භ කරන ලද අතර එය පුළුල් පරාසයක අධ්‍යාපනික සහ විනෝදාස්වාද වැඩසටහන් විකාශනය කිරීමේ අරමුණින් ආරම්භ කරන ලදී. VAPA රූපවාහිනී හි මූලික අධ්‍යාපනික පරමාර්තය වන්නේ දෘශ්‍ය සහ ශ්‍රාසාංගික කලාවන්හි විෂය-විශේෂිත දැනුම සහ භාවිතයන් වැඩිදියුණු කිරීමයි. නාලිකාව විශ්ව විද්‍යාලයේ ඉගැන්වීම්-ඉගෙනීමේ ක්‍රියාවලියේ මෙන්ම දැනුම හා කුසලතා ප්‍රජාව වෙත බෙදා හැරීමේ අංගයකි. එය සතියේ දිනවල පෙරවරු 7.00 සිට පස්වරු 7.00 දක්වා ක්‍රියාත්මක වේ. සති අන්තයේ උදේ 7.00 සිට රාත්‍රී 9.00 දක්වා. 2022 දෙසැම්බර් 31 වන දිනට උපාධි අපේක්ෂකයින් 115 දෙනෙකුට ස්ථානීය අභ්‍යන්තර පුහුණුව ලබා දී ඇත. VAPA රූපවාහිනී හි ගනුදෙනු විශ්වවිද්‍යාල ගිණුම් පොත්වල සටහන් කර ඇත.

A

රාජ්‍ය අංශයේ නව මිණුම්කරණ ප්‍රමිතීන් - ස්ථිරකරු නොවන සහුදෙනු මත ආදායම් සඳහනැනීම (SLPSAS 11) 2021 මාර්තු මාසයේදී නිකුත් කරන ලදී. ප්‍රමිතිය රාජ්‍ය අංශයේ ආයතන සඳහා 2018 ජනවාරි 1 දින හෝ ඊට පසුවැඩ්වෙන වාර්තා කාලවලදී ක්‍රියාත්මක වීය. ප්‍රමිතියෙහි සංශෝධිත වර්ධනයන් අනුව මෙම ප්‍රමිතිය අනුවර්තනය කිරීමට වසර තුනක් ලබා දී ඇත. පෞරුදර්ය සඳහා වීම්ව විදෙසාලය (UVPA) සපුරීය වසර තුන තුළ මෙම ප්‍රමිතිය අනුවර්තනය කර නොමැති බැවින්, UVPA විසින් රඳවා සේ අපැහිති සඳහා වන බලපෑම් සඳහා මිණුම්කරණ ප්‍රමිතීන් (SLPSAS 11) ප්‍රතිසංදනයට අනුව වෙනස් මූල්‍ය ප්‍රකාශන සහිව නවදී නැවත ප්‍රකාශ කර ඇත. තවද SLPSAS 11 ප්‍රකාරව 2021 (නැවත ප්‍රකාශිත) සහ 2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ආයෝජනාත්මක ප්‍රකාශයෙන් 2021 ජනවාරි 1 වන දිනට බැලන්සු කර ඇත, එම බැලන්සු ප්‍රකාශය ප්‍රතිසංයෝජිත පැවතීම් අදාළ නිවැරදි කිරීම් පිළිබිඹු කරයි.

විස්තර	2021 ජනවාරි 01 වන දින අනාවරණය කළ පරිදි	වැඩිමිම	2021 ජනවාරි 01 දිනට නැවත ප්‍රකාශකර ඇති පරිදි	සටහන
සමුච්චිත අතිරික්තය / (ඌනතාවය)	(230,535,418)	(16,445,287)	(246,980,705)	B
මූල ඉද්ධි වත්කම් / ස්වාමිත්වය	4,377,818,040	(24,256,413)	4,402,074,453	C

විස්තර	2022 ජනවාරි 01 වන දින අනාවරණය කළ පරිදි	වැඩිමිම	2022 ජනවාරි 01 වන දිනට නැවත ප්‍රකාශ කර ඇති පරිදි	සටහන
සමුච්චිත අතිරික්තය / (ඌනතාවය) (සමුච්චිත අරමුදල් ප්‍රතිශෝධනය)	(125,925,771)	(20,074,713)	(105,851,058)	D
සමුච්චිත අරමුදල් /ආයෝජනය	-	(2,542,173,315)	2,542,173,315	E
මූල ඉද්ධි වත්කම් / ස්වාමිත්වය	4,594,296,593	(70,548,857)	4,664,845,450	F

අත්හෙන් නැවත ප්‍රකාශ කිරීම සඳහා හැඳින්වීම් කිරීම

B 2021.01.01 දිනට වාර්තා වූ සමුච්චිත අතිරික්තය/ඌනතාවය රුපියල් 230,535,418 ක් වූ අතර එය 2021.01.01 දිනට නැවත ප්‍රකාශිත වටිනාකම වුයේ රුපියල් 246,980,705 කි. ගෙන දැක්වෙන අත්හෙන් නිවැරදි කිරීම් හේතුවෙන් වෙනස්කම් සිදු වේ. (2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සියනාධිය වෙනස්කම් ප්‍රකාශය බලන්න).

(i) 2018 සිට 2020 දක්වා කාලය සඳහා මූල්‍ය නොවන වත්දාන වන ලැන්ඩ් සෘණය නා ප්‍රයෝජනවත්භාවය කරන ලද වාර්ෂික 2ක් සඳහා රුපියල් 7,431,969 ක් අධිතක්සේරුවක් කර ඇත

(ii) 2018 සිට 2020 දක්වා කාලය සඳහා ප්‍රයෝජනවත්භාවය කරන ලද මෝටර් රථ 1ක් සහ කැමි රථ 2ක් සඳහා වැය කරන ලද ක්‍රාන්ධන වත්දාන සඳහා අය කරන ලද රු.9,360,000 ක් අධිතක්සේරුවක් කිරීම

(iii) 2020 වර්ෂය සඳහා පිරි - ලැන්ඩ් සෘණය අවස්ථාවියා කිරීමෙහි පිරිවැය සඳහා රු.346,682 ක් ක්‍රමවත්ය වටිනාකම් වියදම් කළ ක්‍රාන්ධන වත්දාන සඳහා අය කෙරේ..

	රු.	රු.
2021.01.01 දින අනාවරණය කරන ලද සමුච්චිත අතිරික්තය /ඌනතාවය		(230,535,418)
වැඩිමිම :		
අධි ක්‍රමවත්ය - B (i)	(7,431,969)	
අධි ක්‍රමවත්ය - B (ii)	(9,360,000)	
